**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - "ලක්සල"**

LAKSALA
State Gift & Souvenir Boutique
All of Sri Lanka

# ඇබෑර්තු

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල යනු ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරමින් නව්‍ය නිෂ්පාදන ඉදිරිපත් කිරීම සඳහා ග්‍රාමීය ශිල්පී ව්‍යවසායකයන්ට අවස්ථාවන් උදාකර දෙන ස්වයං - මූල්‍යකරණය වන රාජ්‍ය වාණිජ ආයතනයකි.**

## 01. ප්‍රධාන අභ්‍යන්තර විගණක (කොන්ත්‍රාත් පදනම මත - අලුත් කළ හැක)

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණය, ගිණුම්කරණය, වාණිජ්‍ය, ගිණුම්කරණය සහ ව්‍යාපාරික මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධියක්.

**සමඟ**

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය/ගිණුම්කරණය/මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියක් (Master's Degree) හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (ICASL) / වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CIMA) / වරලත් සහතික ලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් වාණිජ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් වාණිජ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර කාණ්ඩයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.
- **පත්වීමේ ස්වභාවය** : සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) හිමිකම් සහිතව කොන්ත්‍රාත් පදනම මත (අලුත් කළ හැක).
- **වෙනත් හිමිකම්** : ජීවන වියදම් දීමනාව (COL), අදාළ දීමනා / ප්‍රවාහන
- **වේතනය** : සාකච්ඡා කර ගත හැක

## 02. අධ්‍යක්ෂ - අලෙවි සහ අපනයන (කොන්ත්‍රාත් පදනම මත - අලුත් කළ හැක)

**බාහිර අයදුම්කරුවන්:**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය, වාණිජ්‍ය, ව්‍යාපාර කළමනාකරණය, ව්‍යාපාර පරිපාලන (අලෙවිකරණ) විශේෂ ප්‍රථම උපාධියක්.

**සමඟ**

2. අලෙවිකරණය, වාණිජ්‍ය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් (Masters).

**සහ**

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් වාණිජ ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර කාණ්ඩයේ (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ).
- **පත්වීමේ ස්වභාවය** : සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) හිමිකම් සහිතව කොන්ත්‍රාත් පදනම මත (අලුත් කළ හැක).
- **වෙනත් හිමිකම්** : ජීවන වියදම් දීමනාව (COL), අදාළ දීමනා / ප්‍රවාහන දීමනාව / අලෙවි දිරිදීමනා
- **වේතනය** : සාකච්ඡා කර ගත හැක

## 03. අලෙවි ප්‍රවර්ධන නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත - අලුත් කළ හැක)

**බාහිර අයදුම්කරුවන් :**

**අධ්‍යාපනික සුදුසුකම් :**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එක් වරකදී ,පහත විෂයන් ඇතුළත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

**සහ**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) විෂයන් තුනක් (03) සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

පහත සුදුසුකම් සපුරා ඇති සහ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ප්‍රාථමික පුහුණු සහ ප්‍රාථමික අර්ධ පුහුණු / නුපුහුණු කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පහත විෂයන් ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයන් හයකින් සමත් වී තිබීම:

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

- **වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.
- **පත්වීමේ ස්වභාවය** : සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) හිමිකම් සහිතව කොන්ත්‍රාත් පදනම මත (අලුත් කළ හැක).
- **වෙනත් හිමිකම්** : ජීවන වියදම් දීමනාව (COL), අදාළ දීමනා / ප්‍රවාහන දීමනාව / අලෙවි දිරිදීමනා
- **වේතනය** : සාකච්ඡා කර ගත හැක

**සෑම අයදුම්කරුවෙකුම;**

- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ කර්තව්‍යයන් මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය..

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිත අයදුම්පත්, මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත, විෂය තීරුවේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර, **chairman@laksala.gov.lk** වෙත පිටපතක් සහිතව **hr@laksala.gov.lk** වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. නැතහොත්, කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

**සභාපති**
**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල**
**නො: 215, බෞද්ධාලෝක මාවත,**
**තුම්මුල්ල, කොළඹ 07.**